මන්ත්‍රීවරයාය. ඔහුගේ වාසනාවට ඔහු තානාපති පදවියක් ලබාගෙන රටින් පිටමං වූයේය. මේ ද්වන්ධ සටනේදී පාතාල බලය හා මත්කුඩු ව්‍යාපාරිකයන්ගේ ආධාර උපකාර ලද පුද්ගලයා ජයග්‍රහනය කළේය. එහෙත් ඔහුගේ හිසට වෙඩි වැදී අඩපන වීමෙන් ජයග්‍රහණය තාවකාලිකව යටපත් විය. භාරත ලක්ෂමන් එම ඡන්ද සටනේදී ඔහුට විරුද්ධව යොදා ගත්තේ දුමින්ද හා සම්බන්ධ මත්ද්‍රව්‍ය ව්‍යාපාරයයි. ඔහුට දුමින්දට සහයෝගයට වේදිකාවට ගොඩවූ ආරක්ෂක ලේකම්වරයාට මල්

***<u>රණ විරුවන් ලේ දහදිය පූජාකළ, රුහිරුවලින් ගොඩගත් රට, පාතාලයේ අමනයන්ට බාරදෙන්නට බැරි ය යි විමල් වීරවංශ ඇමතිවරයා මෑතකදී ප්‍රකාශ කළේය.</u>***

මාලා දැමූ මත්ද්‍රව්‍ය වෙළෙන්දන්ගේ පාතාල මැරයන්ගේ නම් ගම් පවා නොබියව හෙළි කළේය. ආරක්ෂක ලේකම්වරයාට මල් මාලා දමාගත්තේ මත් කුඩු වෙළෙන්දන්ගෙන් බව හෙළිවී ලැබෙන ඡන්ද ප්‍රමාණය අඩුවන විට දුමින්දගේ පළමුවෙනි ඉලක්කය වූ සෝලංගආරච්චිය. එහෙත් ඔහුට මුණගැසුණේ භාරතය.

මුල්ලේරියාවේ ඉතිහාසයත්, එහි වර්තමානයත් පිළිබඳව පාඨකයාට හෙළිකිරීමට සිදු වූ මෙම සිද්ධිය තුළින් අපි වත්මන් පාලකයාට සියළු වැරදි පටවා අත හෝදාගැනීමට මාන බලන්නේ නම් එයද නිවැරදි වන්නේ නැත. එයට ඔහු පමණක් නොව මීට පෙර රට පාලනය කළ නායක නායිකාවන් කිහිපදෙනෙකු ඇතුළු රටේ පැවති වසර 30ක යුද්ධයට ද වගකිව යුතුය. ජේ.ආර්., ප්‍රේමදාස, චන්ද්‍රිකා ඇතුළු රනිල් ද අතීතයේ පාතාලයේ සොල්දාදුවන්ගෙන් වැඩගත් නායකායෝ වෙති. දැන් එය පරම්පරාවෙන් පරම්පරාවට විකාශනය වෙමින් දේශපාලනය තුළ ජානගත වී ඇත. රණ විරුවන් ලේ දහදිය පූජාකළ, රුහිරුවලින් ගොඩගත් රට, පාතාලයේ අමනයන්ට බාරදෙන්නට බැරි යැයි විමල් වීරවංශ ඇමතිවරයා මෑතකදී ප්‍රකාශ කළේය. එහෙත් ඒ පාතාලයේ අමනයන් බොහොමයක් එදා යුද්ධ කළ රණවිරුවන්ම බව ඔහුට නැවත මතක් කිරීමට සිදුවීම කණගාටුවකි. අද කුලියට මිනී මරන බොහෝ පාතාලයේ සොල්දාදුවන් හමුදා පුහුණුවක් ලද යුද්ධයට සම්බන්ධ වූ විරුලේබලය ලද්දන් බව ඔහු දන්නේය.

කරාටේ ධම්මිකලා, රාගම ලොකු සීයලා, චූටි සීයලා අතුරුදන් වන්නේ කාගේ අතින්දැයි අපි නොදනිමු. යුද්ධයෙන් මෙගා පුවත් මැවූ ජනමාධ්‍යවලට අද මේවා ප්‍රධාන පුවත්පත්වල පවා මුල් ශීර්ෂපාඨයක් වුවත් අපිට ඒවා ලොකු පුවත් නොවේ. ජනමාධ්‍ය වෙළන්දන්ට මේවා පහසුවෙන් වෙළඳම් කළ හැකි ය. කරාටේ ධම්මිකලා වැඩිපුර බිහිවන තරමට ඔවුන් සතුටුය. පාතාලය වීරයන් බවට පත්කිරීම පිළිබඳව ජනමාධ්‍යද යම්කිසි තරමකට වගකිව යුතුය. එහෙත් ගෝඨාභයලාගේ නාමය ඉතිහාස ගතවන්නේ අඩපණ වූ දුමින්ද සිල්වා නැතිවිටදී කරාටේ ධම්මිකලා නැති කිරීමෙන් නොවේ. බලය තිබූ දුමින්ද සිල්වා වටා සිටි ධම්මිකලා නැතිකිරී-මෙනි. දුමින්ද සිල්වා සියල්ලෙන් නිදහස් කර කරටේ ධම්මිකලා නැතිකිරීමෙනි. දුමින්ද සිල්වා සියල්ලෙන් නිදහස් කර කරාටේ ධම්මිකලා නැසීම සාපයකි. ඒ ආණ්ඩුවට සෙනග සැපයීමට දුමින්දට උදව් කළේ ධම්මිකලා වන නිසාය. ඒ පිළිබඳව සිතීමට තවමත් රජයට කල් තිබේ. රජවරු තනන්නට වෙහෙසෙන මාධ්‍යවලට කල් තිබේ. නැතිනම් අපිට අනාගතයේ ලිවීමට සිදුවන්නේ භාරත ලක්ෂමන් ප්‍රේමචන්ද්‍ර නැමැති ජනාධිපති උපදේශකවරයා මියගිය අවස්ථාවේ රාජිත සේනාරත්න ඇමතිවරයා ප්‍රකාශ කළ නිවේදනය තරමක් වෙනස් කරය.

"දැන් බලන්න හිතවතුනි, අපි කොහොමද විදේශිකයන්ට මේ රටට එන්න කියන්නේ ? මේ රට අතහැරල ගිය වෘත්තිකයන්ට නැවත මව් රටට එන්න කියන්නෙ. මේ වෙඩි වැදිල මැරිල ඉන්නෙ අපේ රටේ පොඩි බඩුවක් නෙවෙයි. මේ රට ආරක්ෂා කරපු ආරක්ෂක ලේකම් තුමා. කොටින් එල්ල කරපු මරාගෙන මැරෙන බෝම්බෙකුනුත් බේරුණු මෙතුමාට, මේ රට කොටින්ගෙන් බේරගත්තු මෙතුමා, අපේම පාක්ෂිකයෙක් එක්ක හිටපු පාතාලෙ එකෙක් අතින් වෙඩි වැදිලා මැරිල ගියේ කාගේ වරදින්ද ? විනයක් නැති එවුන් ලඟ තබාගන්න හොඳ නැහැ. ඔවුන් පන්නා දැමිය යුතු කාලය උදාවෙලා තියෙන්නෙ."

අපි එසේ නොවේවායි ! පතමු. එළඹෙන නව වසර තුළින්වත් පාතාලය, සොරමැරකම් මත්කුඩුවලින් තොර රටක් ප්‍රාර්ථනා කරමු.


# LANKAN AUTO CARE

**Licensed Roadworthy Tester (R.W.C)**



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




MELWAY REF 89 J 5

**Ranjith Perera**
**Mob: 0409 866 886**

**9798 2200**

**14/30 Tower Court**
**Noble Park 3174**

# IMMIGRATION @ IMMIGRATION LAWYERS

## FAIRFIELDS

**IMMIGRATION LAWYERS - MELBOURNE**

Our team of Specialist Lawyers, Barristers and Registered Migration Agents in Melbourne competently assisted many Sri Lankans, South Asians and many other nationalities and Australian Companies in the following areas of Migration matters over 14 years.

- General Skill Migration Permanent Residence
- General Skill Migration Provisional Residence
- Second stage Skilled Regional (Permanent Residence)
- State Sponsored Skill Migration
- Graduate Skill Temporary visas
- Complex Student visas
- 457 Visas
- Employer Nominations (ENS)
- Employer Contracts
- Negotiations of employer nominations with the Australian Employers
- Regional Sponsored Migration Scheme (RSMS)
- Skill Assessments
- State Sponsorships
- TRA cancellations
- Criminal Prosecutions on TRA cancellations
- Student Visa Cancellations
- Permanent residence Cancelations
- Appeals to the Migration Review Tribunal (MRT)
- Administrative Review Tribunal (AAT)
- Business Migration State Sponsorships
- Business Migration visas
- Spouse & visas
- Aged Parent visas
- Contributory Parent visas
- Resident Return visas
- Australian Citizenships

GUSS DESIGN



**Our Team:**

LAW INSTITUTE OF VICTORIA SPECIALIST ACCREDITATION

**Susantha Katugampala** LL B (Monash)
**Barrister & Solicitor**
Accredited Immigration Law Specialist
MARN: 9601070

**Michael Gros** LL B (Monash)
Consulting Barrister
MARN: 9803398

**Al Noveloso**
Migration Consultant
MARN: 0849632

**Frank Sabelberg** LL B (Monash)
Consulting Solicitor
MARN: 0004726

**Lindy Noone**
Migration Consultant
MARN: 0322507

Sri Lanka
AUSTRALIA GATEWAY
Australian Migration Consultants
**Hilton Colombo Towers**
**200 Union Place Colombo 02**
Telephone: +94 11 2300 627
+94 777 347 670

Australia
FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
**10, Morrison Place**
**East Melbourne Victoria 3002**
Telephone: +61 3 9650 4557
Interstate Callers: **1300 888 331**
Fax: +61 3 9650 4559

E: info@fairfieldslawyers.com Mobile: 0430 699 961 or 0419 863 771

***We Deliver Results..***